(නවවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

**අංක 1(9).]**

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2022 සැප්තැම්බර් 30 සිකුරාදා**

**2022 ඔක්තෝබර් 18 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

3/2022

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ රජයේ ව්‍යවස්ථාපිත ආයතන සඳහා අත්කර ගනු ලබන ඉඩම්වලට ගෙවිය යුතු වන්දි සහ අනෙකුත් පරිපාලන වියදම් අදාළ ආයතනය විසින් දැරිය යුතු බවත්;

(ii) එසේ වුව ද, එම ආයතනවලට මහා භාණ්ඩාගාරයෙන් වෙන් කරනු ලබන ප්‍රතිපාදන ඒ සඳහා භාවිතා කරනු ලබන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මහා භාණ්ඩාගාරයේ ප්‍රතිපාදන මත ව්‍යවස්ථාපිත ආයතනවලට අත්කර ගනු ලබන පෞද්ගලික ඉඩම්, එම ආයතනවලට පැවරීමට අදාළ ක්‍රමවේදය;

(ii) ඊට අදාළ නීතිය;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මහා භාණ්ඩාගාරයේ ප්‍රතිපාදන මත ව්‍යවස්ථාපිත ආයතන සඳහා අත්කර ගනු ලබන පෞද්ගලික ඉඩම්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන අනුව පැවරීමේ සහතිකයක් මඟින් එම ආයතනවලට පවරන ලෙස ඉඩම් අමාත්‍යාංශය විසින් ප්‍රාදේශීය ලේකම්වරුන්ට උපදෙස් දී ඇති බවත්;

(ii) එසේ උපදෙස් ලබා දීම, ඉහත පනතේ විධිවිධානවලට, ඉඩම් නියෝගවලට සහ චක්‍රලේඛවලට පටහැනි බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) එසේ නම්, මෙම තත්ත්වය නිවැරදි කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

3154/2022

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ සීමාසහිත විවිධ සේවා සමුපකාර සමිති සංඛ්‍යාව;

(ii) එම සමුපකාර සමිතිවල සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව;

(iii) එම සමූපාකාර සමිති විසින් පාලනය කරනු ලබන ප්‍රාදේශීය අලෙවිසල් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් සමූපකාර සමිති මඟින් ලබා දෙනු ලබන සේවාවන්;

(ii) කුරුණෑගල දිස්ත්‍රික්කයේ සමූපකාර ව්‍යාපාරය දියුණු කිරීම සඳහා ගනු ලබන පියවර;

කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3164/2022

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2020 සිට 2022 දක්වා ලංකා විදුලිබල මණ්ඩලයේ අලාභය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එලෙස අලාභ ලැබීමට හේතු වූ සාධක කවරේද;

(iii) ලංකා විදුලිබල මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලබා දෙන ලද දිනය කවරේද;

(iv) එම ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3169/2022

ගරු මයන්ත දිසානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ ජාතික පාසල් සහ පළාත් පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් ජාතික පාසලේ සහ පළාත් පාසලේ සේවය කරනු ලබන ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් පාසලේ විදුහල්පති සහ ගුරු තනතුරුවල මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iv) එම පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3206/2022

ගරු මිලාන් ජයතිලක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සූර්ය පියසි පැනල මඟින් ජාතික විදුලිබල පද්ධතියට විදුලිය ලබාදෙන නිවාස සංඛ්‍යාව;

(ii) එම සූර්ය පියසි පැනල මඟින් වාර්ෂිකව උත්පාදනය කරනු ලබන විදුලි ඒකක සංඛ්‍යාව;

(iii) එම සූර්ය පියසි පැනල මඟින් ජාතික විදුලිබල පද්ධතියට එකතු කරනු ලබන විදුලි ඒකක සංඛ්‍යාව;

(iv) ඉහත (iii)හි සඳහන් විදුලිය ඒකකයක් සඳහා පාරිභෝගිකයාට ගෙවනු ලබන මුදල;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3220/2022

ගරු සුදත් මංජුල මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය සමත් වන සිසුන් සඳහා වාර්ෂිකව විදේශ ශිෂ්‍යත්ව පිරිනමන්නේද;

(ii) එසේ නම්, එම ශිෂ්‍යත්ව පිරිනමනු ලබන ක්‍රමවේදය කවරේද;

(iii) එම ශිෂ්‍යත්ව පිරිනමනු ලබන විෂය ක්ෂේත්‍ර කවරේද;

(iv) එම ශිෂ්‍යත්ව පිරිනමනු ලබන රටවල් කවරේද;

(v) වර්ෂ 2015 සිට මේ දක්වා පිරිනමා ඇති ශිෂ්‍යත්ව සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3231/2022

ගරු හර්ෂණ රාජකරුණා මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව ජාතික පාසල් 1000ක් ස්ථාපිත කිරීමේ වැඩසටහන යටතේ ජාතික පාසල් ලෙස උසස් කිරීම සඳහා තෝරා ගන්නා ලද පාසල් කවරේද;

(ii) එම පාසල් අතරින් මේ වනවිට ජාතික පාසල් ලෙස උසස් කර, ගැසට් පත්‍රයේ පල කර ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉතිරි පාසල්, ජාතික පාසල් ලෙස උසස් කර, ගැසට් පත්‍රයේ පල කරනු ලබන දිනය කවරේද;

(iv) ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(v) ජාතික පාසල් ලෙස උසස් කරන ලද පාසල් මධ්‍යම රජය වෙත පවරාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3233/2022

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020 වර්ෂයේදී රජයේ රැකියා සඳහා උපාධිධාරී අභ්‍යාසලාභීන් අන්තර්ග්‍රහණය කිරීමේදී අභ්‍යන්තර සහ බාහිර උපාධිධාරීන්ගෙන් අයදුම්පත් කැඳවන ලද බව දන්නේද;

(ii) උපාධිධාරීන් අභ්‍යාසලාභීන් ලෙස අන්තර්ග්‍රහණය කිරීමේදී විදේශීය විශ්වවිද්‍යාල මඟින් උපාධිය ලබා ගන්නා ලද උපාධිධාරීන් අන්තර්ග්‍රහණය නොකිරීමට හේතුව කවරේද;

(iii) රජයේ රැකියා සඳහා අයදුම්පත් කැඳවීමේදී ඒ බව අවධාරණය නොකිරීමට හේතුව කවරේද;

(iv) අභ්‍යාසලාභීන් ලෙස අන්තර්ග්‍රහණය නොකරන ලද විදේශීය විශ්වවිද්‍යාල මඟින් උපාධිය ලබා ගන්නා ලද උපාධිධාරීන් සඳහා ලබා දෙනු ලබන විසඳුම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3260/2022

ගරු මර්ජාන් ෆලීල් මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මැණික් අපනයනය කිරීමේදී අය කරනු ලබන බදු වර්ග කවරේද;

(ii) මැණික් අපනයනයෙන් ලැබෙන ආදායම මත අය කරනු ලබන බදු වර්ග කවරේද;

(iii) මැණික් අපනයනකරුවන්ට බදු සහන ලබා දෙන්නේද;

(iv) මැණික් අපනයනය දිරිගැන්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3268/2022

ගරු දිලිප් වෙදආරච්චි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2020 දක්වා වූ කාල සීමාව තුළදී ආසියානු සංවර්ධන බැංකුව මඟින් නගර සභා 10 ක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට ආධාර ලබා දුන් බවත්;

(ii) මෙම ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කිරීම සඳහා තංගල්ල නගර සභාව තෝරාගන්නා ලද බවත්;

(iii) ව්‍යාපෘති වැඩ කටයුතු මේ වනවිට නවතා දමා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම ව්‍යාපෘතියේ වැඩ කටයුතු නැවත ආරම්භ කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2022 ඔක්තෝබර් 19 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

31/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත ශ්‍රී ලංකන් ඒයාර් ලයින් ආයතනයේ වර්තමාන සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් ගුවන්තොටුපළ සේවා නියෝජිත සේවක / සේවිකාවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ගුවන් සේවිකාවන් අතරින් පියාසර ගුවන් සේවිකාවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ගුවන් සේවිකාවන් බඳවාගැනීමේදී සලකා බලනු ලබන අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ගුවන් සේවිකාවන් බඳවාගැනීමේදී අවිවාහක බව අවම සුදුසුකමක් වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) විවාහක බව සඟවමින් සමහර කාන්තාවන් ගුවන් සේවිකාවන් ලෙස සේවයට බැඳී ඇති බව දන්නේද;

(ii) ඒ හේතුවෙන් නියමිත සුදුසුකම් සපිරූ පිරිසකට අසාධාරණයක් සිදු වී ඇති බව පිළිගන්නේද;

(iii) මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කර ඉහත ඇ(1) හි සඳහන් පරිදි ගුවන් සේවිකාවන් ලෙස සේවයට බැඳී ඇති කාන්තාවන්ට සහ ඔවුන් බඳවාගැනීමට ක්‍රියාකරන ලද පුද්ගලයන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

298/2022

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුණ්ඩසාලේ, දිගන ප්‍රදේශයේ අලුත්වත්ත, ගහපිටිය, විජය ශ්‍රී ගම, අක්කර 30, අඹකොටේ යන වසම්වල හුණුගල් කැඩීමේ කර්මාන්තය ක්‍රියාත්මක වන බවත්;

(ii) දිගන ප්‍රදේශයේ භූ කම්පන ඇති වීමට එම කර්මාන්තය බලපා ඇත්දැයි කරන ලද පර්යේෂණවල නිගමන සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු බවත්;

(iii) නීත්‍යානුකූල බලපත්‍ර ලබා දීමේදී ඉහත නිගමන හා පරිසර නීති අවධානයට ගත යුතු බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත ප්‍රදේශවල දේපළ හා පාරිසරික හානි සිදු වී ඇති බව දන්නේද;

(ii) එම ප්‍රදේශවල භූ කම්පන ඇති වීමට ඉහත කර්මාන්තය බලපා ඇති බව පර්යේෂණ මඟින් සනාථ වී තිබේද;

(iii) එසේ නම්, බලපත්‍ර දීමේදී පර්යේෂණ මඟින් සනාථ වී ඇති කරුණු පිළිබඳව අවධානය යොමු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත ප්‍රදේශවල බලපත්‍රලාභී හුණුගල් කර්මාන්තකරුවන් සංඛ්‍යාව;

(ii) අනවසර කර්මාන්තකරුවන් සංඛ්‍යාව;

(iii) ඔවුන්ට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග;

(iv) කර්මාන්තය හේතුවෙන් ඍජු හා වක්‍ර ලෙස පීඩාවට ලක් වී ඇති නිවාස සංඛ්‍යාව;

කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

345/2022

ගරු හේෂා විතානගේ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ බිත්තර නිෂ්පාදනය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාලය තුළ බිත්තර අපනයනය කරනු ලැබුවේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

(iii) ඉහත කාලය තුළ බිත්තර ආනයනය කරනු ලැබුවේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

(iv) ශ්‍රී ලංකාවේ බිත්තර නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

674/2022

ගරු කිංස් නෙල්සන් මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ හිඟුරක්ගොඩ ඇතුළු ප්‍රදේශ රැසක ජීවත්වන පවුල් විශාල සංඛ්‍යාවක් විසිතුරු මල් වගා කිරීමේ නිරත වන බවත්;

(ii) එම වගාකරුවන්ට අවශ්‍ය පස් ලබා ගැනීමේ දුෂ්කරතා සහ මල් සඳහා ස්ථාවර මිලක් නොමැති වීම හේතුවෙන් ඔවුන් ගැටලු රැසකට මුහුණ දී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, ඉහත සඳහන් ගැටලු විසඳීම සඳහා ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

967/2022

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වාලච්චේන කඩදාසි කර්මාන්තශාලාවේ වර්තමාන තත්ත්වය;

(ii) එම කර්මාන්තශාලාවේ නිෂ්පාදන කටයුතු නැවත ආරම්භ කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග;

(iii) ඒ සඳහා ආයෝජනය කරන ලද මුදල හා එම මුදල ආයෝජනය කරන ලද දිනය;

(iv) එමඟින් උත්පාදනය වන රැකියා සංඛ්‍යාව;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත කර්මාන්තශාලාව සම්බන්ධයෙන් වංචා හා දූෂණ සිදු වන බව දන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1107/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහ බැංකු බැඳුම්කර වංචාව සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවක් පත් කරන ලද දිනය කවරේද;

(ii) එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති නිර්දේශ කවරේද;

(iii) එම බැඳුම්කර වංචාවට සෘජුවම සම්බන්ධ පුද්ගලයන්ගේ නම් කවරේද;

(iv) එම බැඳුම්කර වංචාව සම්බන්ධයෙන් මේ දක්වා ගෙන ඇති ක්‍රියාමාර්ගය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1514/2022

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018 පළාත් පාලන මැතිවරණය පැවැත්වීමට පෙර පළාත් පාලන ආයතනවල සභිකයන් ලෙස කටයුතු කරන ලද ක්ෂේත්‍ර නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් නිලධාරියා සේවය කරන ලද ආයතනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඔවුන් අතරින් සභාපති/උප සභාපති/නගරාධිපති/උප නගරාධිපති ලෙස කටයුතු කරන ලද සංඛ්‍යාව හා එම පළාත් පාලන ආයතන කවරේද;

(iv) ඉහත (i) හි සඳහන් නිලධාරින් අතරින් පළාත් පාලන ආයතනවල සභිකයන් ලෙස කටයුතු කරන ලද සමෘද්ධි සංවර්ධන නිලධාරින් සහ කෘෂි පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(v) ඔවුන් අතරින් සභාපති/උප සභාපති/නගරාධිපති/උප නගරාධිපති ලෙස කටයුතු කරන ලද සංඛ්‍යාව හා එම පළාත් පාලන ආයතන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ක්ෂේත්‍ර නිලධාරින්ට මැතිවරණයට ඉදිරිපත් වීම තහනම් කරමින් එවකට රජය ගෙන ආ නීති හේතුවෙන් (අ)(iv)හි සඳහන් නිලධාරින්ට අසාධාරණයක් සිදු වූ බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එය නිවැරදි කිරීමට ගනු ලබන පියවර කවරේද;

(iii) ඊට අදාළ පනත සංශෝධනය කිරීමට කටයුතු කරන්නේද;

(iv) එම දිනය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1526/2022

ගරු ඉෂාක් රහුමාන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කලාවැව - පැන්නුම රජයේ රෝහල මහවැලි ව්‍යාපාරය ආරම්භ කිරීමටත් පෙර සිට ආරම්භ කරන ලද රෝහලක් බවත්;

(ii) මේ වනවිට එම රෝහලේ ගොඩනැගිලි ඉතා අබලන් තත්ත්වයක පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම රෝහලේ ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම සඳහා පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා මුදල් වෙන්කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1672/2022

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වතුකරයේ ජීවත් වන පවුල් අතරින් මේ වනවිට සමෘද්ධි සහනාධාරය ලබන පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) සමෘද්ධි ප්‍රතිලාභය වතුකරයේ ජීවත් වන පවුල් වැඩි සංඛ්‍යාවකට ලබා දීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1895/2022

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කාබනික පොහොර ප්‍රචලිත කිරීමේ වැඩසටහන හේතුවෙන් 2022 මහ කන්නයේ වී අස්වැන්න විශාල ලෙස අඩු වී තිබෙන බව දන්නේද;

(ii) ඒ සඳහා වන්දි ලබා දීමට පියවර ගෙන තිබේද;

(iii) එසේ නම්, මේ වනවිට ලබා දී ඇති වන්දි මුදල කොපමණද;

(iv) මේ දක්වා වන්දි ලබා දී ඇති ගොවීන් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) වන්දි ලබා දීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2022 ඔක්තෝබර් 20 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2000/2022

ගරු ජේ.සී. අලවතුවල මහතා,— මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට වාහන අමතර කොටස්වල සහ ටයර්වල හිඟයක් පවතින බවත්;

(ii) ඒ හේතුවෙන් වාහන හිමිකරුවන් දුෂ්කරතාවයට පත් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වාහන අමතර කොටස් සහ ටයර් ආනයනය සීමා කිරීම, ඉහත හිඟයට හේතු වී තිබේද;

(ii) එසේ නම්, වාහන අමතර කොටස් සහ ටයර් ආනයනය කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2042/2022

ගරු වේලු කුමාර් මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 1992 දී වැවිලි ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණයක් සිදු කරන ලද බවත්;

(ii) එම අවස්ථාවේදී රජයේ වතු, ප්‍රාදේශීය වැවිලි සමාගම් 22 කට බදු දෙන ලද බවත්;

(iii) මේ වනවිට එම සමාගම් රාශියක් එම වතු වෙනත් ආයතනයන්ට අතුරු බදු දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වර්ෂ 1992 දී රජයේ වතු බද්දට ලබා ගන්නා ලද ප්‍රාදේශීය වතු සමාගම් කවරේද;

(ii) මුල් බදු ගිවිසුම් යටතේ මේ වනවිට වතු පාලනය කරනු ලබන සමාගම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2060/2022

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට සිමෙන්ති කර්මාන්තශාලාව ඉදිකිරීම සඳහා ලබා දෙන ලද ඉඩමේ විශාලත්වය කොපමණද;

(ii) ඉහත කර්මාන්තශාලාව ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා වන ආයෝජනය කොපමණද;

(iii) ඉහත ව්‍යාපෘතිය සඳහා වූ ආයෝජන ගිවිසුමට එළැඹි දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2170/2022

ගරු රෝහණ බංඩාර මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගලෙන්බිඳුණුවැව ප්‍රදේශයේ ගැටලාව, දුටු වැව, තිසා වැව සහ මයිල්ගස් වැව යන ප්‍රදේශවල විශාල වශයෙන් ලූනු වගා කරන ලද බවත්;

(ii) ලූනු සඳහා නිසි මිලක් නොලැබීම හේතුවෙන් ලූනු තොග විශාල ප්‍රමාණයක් මේ වනවිට ගොවීන්ගේ නිවෙස්වල ගබඩා කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත සඳහන් ගම්වල ගොවීන් විසින් ගබඩා කර ඇති ලූනු අලෙවිකර ගැනීම සඳහා ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2517/2022

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2010 සිට මේ දක්වා පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීම සඳහා තෝරා ගන්නා ලද විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් කවරේද;

(iii) ඒ සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ඉහත සඳහන් ආචාර්යවරුන් අතරින් සිය පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීම අතරමඟ නවතා දමා ඇති ආචාර්යවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් කවරේද;

(iii) ඒ හේතුවෙන් අපතේ ගොස් ඇති මුදල කොපමණද;

(iv) මෙම තත්ත්වය පාලනය කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2538/2022

ගරු මධුර විතානගේ මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා කප්රුක අරමුදලේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධි ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2554/2022

ගරු කුමාරසිරි රත්නායක මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා ජාතික ආරක්ෂක විද්‍යායතනයේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිව යුතු නිලධාරින් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරින් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2566/2022

ගරු සංජීව එදිරිමාන්න මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මගී ප්‍රවාහනයට අමතරව ශ්‍රී ලංකාවේ දුම්රිය සේවය මඟින් භාණ්ඩ ප්‍රවාහනය කරන්නේද;

(ii) එසේ නම්, එසේ ප්‍රවාහනය කරනු ලබන භාණ්ඩ වර්ග කවරේද;

(iii) එම භාණ්ඩ ප්‍රවාහනය කරනු ලබන ප්‍රදේශ කවරේද;

(iv) භාණ්ඩ ප්‍රවාහනය මඟින් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව උපයනු ලබන වාර්ෂික ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව පෞද්ගලික ආයතන සමඟ ගිවිසුම් ගත වී තිබේද;

(ii) එසේ නම්, එම පෞද්ගලික ආයතනවල නම් කවරේද;

(iii) එම ආයතන සමඟ ගිවිසුම් ගත වීම විනිවිදභාවයකින් යුතුව සිදු කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2585/2022

ගරු ලලිත් වර්ණ කුමාර මහතා,— මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුඩා පරිමාණ ව්‍යවසායකයන් සඳහා "ජය ඉසුරු" සහන ණය යෝජනා ක්‍රමය මේ වනවිට ක්‍රියාත්මක කරන්නේද;

(ii) එම ණය යෝජනා ක්‍රමය මඟින් ණය ලබා ගෙන ඇති ව්‍යවසායකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) ලබා ගත් ණය අදාළ ව්‍යවසාය සඳහා යොදා ගෙන තිබේද යන්න පිළිබඳව අධීක්ෂණය කර තිබේද;

(iv) ඉහත ණය යෝජනා ක්‍රමයේ අපේක්ෂිත ප්‍රතිලාභ මේ වනවිට ලැබී තිබේද;

(v) එම ණය යෝජනා ක්‍රමය යටතේ ඉදිරියේදී ණය ලබා දීමට අපේක්ෂිත ව්‍යවසායකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2886/2022

ගරු මායාදුන්න චින්තක අමල් මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශයේ ප්‍රාදේශීය කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම ප්‍රාදේශීය කාර්යාල ස්ථාපිත කර ඇති ප්‍රදේශ කවරේද;

(iii) එම කාර්යාල පවත්වාගෙන යාම සඳහා කුලී පදනම මත ගොඩනැගිලි ලබා ගෙන තිබේද;

(iv) එසේ නම්, එම ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(v) කුලී පදනම මත ලබාගත් ගොඩනැගිලි වල කාර්යාල ස්ථාපිත කර ඇති ප්‍රදේශ කවරේද;

(vi) එම ප්‍රාදේශීය කාර්යාල සඳහා ගෙවනු ලබන වාර්ෂික කුලී මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2022 ඔක්තෝබර් 21 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2590/2022

ගරු තිස්ස අත්තනායක මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බොහෝ බස් ඩිපෝ අංගනවල තත්ත්වය ඉතා පහත් මට්ටමක පවතින බවත්;

(ii) ඒ හේතුවෙන් මගීන් සඳහා කාර්යක්ෂම ප්‍රවාහන සේවයක් ලබා දීමට සහ සේවකයන්ගේ සුභ සාධනයට ද එම තත්ත්වය බාධාවක් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් ඩිපෝ අංගන නවීකරණය කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර තිබේද;

(ii) එසේ නම්, එසේ නවීකරණය කිරීමට සැළසුම් කර ඇති එක් එක් ඩිපෝවේ නම, එය අයත්වන ප්‍රාදේශිකයේ නම, ඇස්තමේන්තුගත මුදල, වැඩ ආරම්භ කිරීමට අපේක්ෂිත කාල වකවානුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) බස් ඩිපෝ අංගන නවීකරණය කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ නොකරන්නේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2604/2022

ගරු අශෝක් අබේසිංහ මහතා,— මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2022 දක්වා රජය විසින් අනුමතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද ණය ලබා ගැනීමේ සීමාවන්;

(ii) වර්ෂ 2015 සිට 2022 දක්වා රජය විසින් ගෙවිය යුතු ණය වාරිකය හා පොලිය;

(iii) 2020 සහ 2022 වර්ෂවල රජය විසින් අනුමතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද ණය ලබා ගැනීමේ සීමාවන්;

(iv) 2020 සහ 2022 වර්ෂවල රජය විසින් ගෙවිය යුතු ණය වාරිකය හා පොලිය;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ගෙවීමට ඇති ණය ප්‍රමාණය ඉක්මවා ණය සීමාවන් අනුමත කිරීමට හේතු කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2624/2022

ගරු ඩී. වීරසිංහ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "ජාතික පාසල් 1000 වැඩසටහන" යටතේ මේ වනවිට ආරම්භ කර ඇති ජාතික පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉතිරි ජාතික පාසල් ආරම්භ කරනු ලබන දිනය කවරේද;

(iii) පවතින ජාතික පාසල්වලට හිමි යටිතල පහසුකම් හා අනෙකුත් පහසුකම් ඉහත වැඩසටහන යටතේ ආරම්භ කරනු ලබන පාසල් සඳහා ද ලබා දෙන්නේද;

(iv) ඉහත වැඩසටහන අවසන් කරනු ලබන දිනය කවරේද;

(v) උග්‍ර ගුරු හිඟයක් පවතින පාසල්වල ගුරු පුරප්පාඩු පුරවනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2632/2022

ගරු සම්පත් අතුකෝරළ මහතා,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම්වල ඉදිකර ඇති අනවසර ඉදිකිරීම් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2015 සිට මේ දක්වා ඉවත් කර ඇති අනවසර ඉදිකිරීම් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත දෙපාර්තමේන්තුව සතු ඉඩම් බදු පදනම මත ලබා දී තිබේද;

(iv) එසේ නම්, එලෙස ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) එම ඉඩම් බදු දීම මඟින් උපයාගෙන ඇති ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2642/2022

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සී/ස ලක් සතොස ආයතනයේ ශාඛා ජාලය නවීකරණය කිරීමට කටයුතු කරන්නේද;

(ii) මේ වනවිට එම ආයතනය සතු ශාඛා සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පාරිභෝගිකයන්ට හිඟයකින් තොරව භාණ්ඩ ලබා ගැනීම සඳහා වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(ii) සහල්, පරිප්පු, සීනි, වියළි මිරිස්, කුකුළු මස්, බිත්තර සහ කිරිඟු පිටි වැනි භාණ්ඩ මේ වනවිට වෙළඳපළේ පවතින මිලට වඩා අඩු මිලකට ලබා දීමට හැකියාවක් තිබේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් පවතින වැඩපිළිවෙළ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2645/2022

ගරු ගාමිණී වලේබොඩ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2021 වර්ෂයේදී පනවන ලද රසායනික පොහොර තහනම හේතුවෙන් ශ්‍රී ලංකාවට සිදු වූ ආර්ථික බලපෑම ගණනය කර තිබේද;.

(ii) එසේ නම්, වී, තේ, රබර්, කුරුඳු , පොල්, සහ එළවළු ආදී එක් එක් භෝගයේ නිෂ්පාදනයේ සිදු වූ පහත වැටීම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) රසායනික පොහොර තහනම් කිරීම හේතුවෙන් ගොවීන් ගොවිතැන් කිරීමෙන් ඉවත් වී තිබේද;

(iv) එසේ නම්, එම ගොවීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2651/2022

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සතු සමාගම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් සමාගම පිහිටා ඇති ස්ථානය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මණ්ඩලය සතු සංචාරක නිවාඩු නිකේතන සංඛ්‍යාව කොපමණද;

(iv) ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික ආදායම කොපමණද;

(v) එම ආයතනයේ ඉදිරි සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2661/2022

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ විසිතුරු මත්ස්‍ය අපනයනකරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම අපනයනකරුවන් දිරිගැන්වීම සඳහා මේ වනවිට විධිමත් වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(iii) ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය හා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය අතර විධිමත් සම්බන්ධීකරණයෙන් එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක වන්නේද;

(iv) නව විසිතුරු මත්ස්‍ය අපනයනකරුවන් ලියාපදිංචි කිරීම සඳහා වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වන්නේද;

(v) එසේ නම්, එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරනු ලබන ප්‍රදේශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2689/2022

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් ඉඩම්, පෞද්ගලීකරණය කර තිබූ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සහ එවකට ඇපලෝ රෝහල නැවත රජයට පවරා ගන්නා ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දෙන ලද නියෝගය ප්‍රකාරව ඊට වගකිව යුතු පුද්ගලයන් සම්බන්ධයෙන් ගනු ලබන පියවර පිළිබඳව 2016.08.23 දින මා විසින් වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නයක් ඇසූ බවත්;

(ii) පෙර පැවති රජය කිසිදු පියවරක් නොගැනීම හේතුවෙන් නීතිපති දෙපාර්තමේන්තුව ඒ සම්බන්ධයෙන් සී.ආර්.අයි./159/2016 දරන අංකය යටතේ නැවත ලිපි ගොනුවක් ආරම්භ කර 55 දෙනෙකුගෙන් ප්‍රකාශ සටහන් කර ගත් අතර තවත් කීපදෙනෙකුගෙන් ප්‍රකාශ ලබා ගත් පසුව නීතිමය පියවර ගැනීමට කටයුතු කරන බව එම ප්‍රශ්නය සඳහා පිළිතුර ලෙස ලබා දෙන ලද බවත්;

(iii) ඒ අනුව, විමර්ශන කටයුතු අවසන් කර තොරතුරු පොතේ උධෘත ලැබුණු පසු ඉදිරි පියවර ගන්නා බවට නීතිපතිවරයා දන්වා ඇති බව වැඩිදුරටත් සඳහන් කළ බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) එසේ නම්, ඊට පසුව නීතිපතිවරයා විසින් වගකිව යුතු පුද්ගලයන්ට එරෙහිව නීතිමය පියවර ගෙන තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2725/2022

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "බැටික්ලෝ කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ්" නමින් ආයතනයක් ස්ථාපිත කර තිබේද;

(ii) එම නාමය භාවිතා කරමින් විශ්වවිද්‍යාලයක් පවත්වාගෙන යනු ලබන්නේද;

(iii) එම විශ්වවිද්‍යාලය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමතිය ලැබී තිබේද;

(iv) එම විශ්වවිද්‍යාලයේ උගන්වනු ලබන පාඨමාලාවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත විශ්වවිද්‍යාලය ඉදිකිරීම සඳහා මුදල් සපයා ගන්නා ලද ආකාරය කවරේද;

(ii) විශ්වවිද්‍යාලය පවත්වාගෙන යාම සඳහා මුදල් සපයා ගනු ලබන ආකාරය කවරේද;

(iii) එම විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය හදාරනු ලබන සිසුන්ගෙන් මුදල් අය කරන්නේද;

(iv) එසේ නම්, එක් සිසුවකුගෙන් අය කරනු ලබන මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?